# රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල
## 3 ශ්‍රේණිය - 2020
## මව් බස
## පළමු වාර පාඩම් අභ්‍යාස - 03

<u>දෙමව්පියන්ගේ අවධානයට</u>

**මෙම වැඩ පැවරුම සිදුකිරීමට දරුවාට වැඩිහිටි අයෙකුගේ සහය ලබාදෙන්න.**

01.මෙම ඡේදය දරුවාට තෙවරක් සවන්දීමට සලස්වන්න.

සුනිල්ගේ පොඩි වුණු සුදු කමිස අතෙහි මඩ පැල්ලමක් තිබුණේය. නිල් කලිසමත් කිලිටි ය. එදා සිකුරාදා නිසා ඒකට නම් කමක් නැත. සඳුදාට අලුත් ඇඳුමක් අඳින හෙයිනි. කළු සපත්තු ජෝඩුව දූවිල්ලෙන් වැසී තිබුණේ ය. ඒ දුටු සුනිල් තනි කකුලින් සිටගෙන අළු පාට මේස්වලින් සපත්තු පිසදා ගත්තේ ය. වමින් බෙදා පීරා තිබුණු බොකුටු හිසකෙස් තරමක් අවුල් වී තිබිණි. පළල් නළලෙහි ඩහදිය මුසු දූවිලි රැඳී තිබුණේය.

අඹ යහළුවෝ - ටී. බී. ඉලංගරත්න

02. ඡේදය ඇසුරෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු වාචිකව ලබාගන්න.

1) මෙම ඡේදයේ සඳහන් වන ළමයාගේ නම කුමක්ද?
2) ඔහුගේ සුදු කමිස අතේ ගෑවී තිබුණේ මොනවාද?
3) ඔහුගේ කලිසම කුමන පාටද?
4) ඔහු අලුත් ඇඳුමක් අඳින්නේ කවදාද?
5) දූවිල්ලෙන් වැසී තිබුණේ කුමක්ද?
6) පළල් නළලේ රැඳි තිබුණේ මොනවාද?

02. ඉහත දක්වන ලද ඡේදයේ පිටපතක් ( අතින් ලියා හෝ ) දරුවාට ලබා දෙන්න.

> සුනිල්ගේ පොඩි වුණු සුදු කමිස අතෙහි මඩ පැල්ලමක් තිබුණේය. නිල් කලිසමත් කිලිටි ය. එදා සිකුරාදා නිසා ඒකට නම් කමක් නැත. සඳුදාට අලුත් ඇඳුමක් අඳින හෙයිනි. කළු සපත්තු ජෝඩුව දූවිල්ලෙන් වැසී තිබුණේ ය. ඒ දුටු සුනිල් තනි කකුලින් සිටගෙන අළු පාට මේස්වලින් සපත්තු පිසදා ගත්තේ ය. වමින් බෙදා පීරා තිබුණු බොකුටු හිසකෙස් තරමක් අවුල් වී තිබිණි. පළල් නළලෙහි ඩහදිය මුසු දූවිලි රැඳී තිබුණේය.
>
> අඹ යහළුවෝ - ටී. බී. ඉලංගරත්න

03. පහත සඳහන් වචන ඡේදයෙන් සොයා රවුම් කිරීමට උපදෙස් දෙන්න.

1) බොකුටු 2) ජෝඩුව 3) සුදු කමිස 4) නළලෙහි

5) සිකුරාදා 6) දූවිලි 7) ඇඳුමක් 8) පැල්ලමක්

9) කළු සපත්තු 10) සඳුදා

04. එම වචන කියවීමට පවසන්න.

05. එම වචන රූලෙන් 3/4 ප්‍රමාණයට බලා ලිවීමට පවසන්න.

06. ඡේදයේ පළමු වාක්‍ය සහයවන්නාත්; දෙවන වාක්‍ය දරුවාත් ආදී වශයෙන් දෙවතාවක්වත් කියවන්න.

07. පහත පැවරුමේ පිටපතක් දරුවාට ලබා දෙන්න.

**<u>පැවරුම 01</u>**

ඡේදය පිළිබඳව පහත වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණද; වැරදි නම් (✕) ලකුණද යොදන්න.

1) සුනිල්ගේ කලිසම පොඩි වී ඇත. ( )

2) සුනිල් සඳුදාට අලුත් ඇඳුමක් අඳියි. ( )

3) සුනිල්ට ඇත්තේ නිල් කලිසමකි. ( )

4) සුදු සපත්තු ජෝඩුවේ දූවිල්ල තිබිණි. ( )

5) සුනිල්ගේ කොණ්ඩය බොකුටුය. ( )

**<u>පැවරුම 02</u>**

<u>වරහන් තුළින් නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.</u>

1. සුනිල්ගේ සුදු කමිස අතෙහි (මඩ පැල්ලමක්/කහට පැල්ලමක්) තිබිණි.
2. සුනිල්ගේ (සුදු කලිසම/නිල් කලිසම) කිලිටි ය.
3. කළු (සපත්තු/සෙරෙප්පු) ජෝඩුව දූවිල්ලෙන් වැසී තිබුණේ ය.
4. (සිකුරාදාට/සඳුදාට) සුනිල් අලුත් ඇඳුමක් අඳියි.
5. සුනිල් (අළු පාට/සුදු පාට) මේස්වලින් සපත්තු පිසදා ගත්තේ ය.

08. ප්‍රශ්න අංක 03 හි රවුම් කරන ලද වචන අසා ලිවීමට දෙන්න.